## 10. අධීක්ෂණ හා ඇගැයීම් නිලධාරී (PS6 - ප්‍රවර්ගය A) - තනතුරු 01 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකයහි

### සුදුසුකම් : පහත (අ) හෝ (ආ) හෝ (ඇ)

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කෘෂිකර්මයට/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් **හෝ** ඉහත **හෝ** අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තියවේදී ආයතනයකින් ලබාගත් එහි ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තියවේදී සුදුසුකමක් **හෝ** අධීක්ෂණ හා ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම **සහ** ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ හා ඇගයීම් ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 3 ක පළපුරුද්ද

(ආ) අධීක්ෂණ හා ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් ලබාගත්/ නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තිය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම සහ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ හා ඇගයීම් ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 8 ක පළපුරුද්ද.

(ඇ) අධීක්ෂණ හා ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තිය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ ව්‍යාපෘති කළමනාකරණ **සහ** අධීක්ෂණ හා ඇගයීම් කටයුතු පිළිබඳව අඩුම තරමින් වසර 13 ක පළපුරුද්ද.

### ලුහුඬු රැකියා විස්තරය :

අධීක්ෂණ හා ඇගැයීම් නිලධාරියා විසින්, අධීක්ෂණ හා ඇගයීම් විශේෂඥවරයා හට, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයට අනුබද්ධ අධීක්ෂණ හා ඇගයීම් නිලධාරීන් හා සමග සමීප සම්බන්ධතා පවත්වමින්, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සඳහා මාසික ආදාන, ප්‍රතිදාන හා ප්‍රතිඵල පිළිබඳ තොරතුරු සකස් කිරීම හා පිළියෙල කිරීම, සංග්‍රහගත කිරීම හා වලංගුකරණ මගින්, සැකසුම්, අනුකූලවීම් සහ ප්‍රතිඵල අධීක්ෂණය හා නිරීක්ෂණය සිදුකිරීම තුළින් සමස්ත ව්‍යාපෘති අධීක්ෂණ හා ඇගයීම් ප්‍රද්ධතිය ක්‍රියාකරවීම සඳහා සහයවීම ඔහු/ ඇය පළාත් මට්ටමේ කාර්යාලවල අධීක්ෂණ හා ඇගයීම් නිලධාරීන්ගේ සහයෝගය සමගින් තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර ගනිමින්, ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම හා ක්‍රියාකරවීම/ මෙහෙය වීම පිළිබඳව වගකීම් භාරය දැරිය යුතුය.

## 11. මූල්‍ය නිලධාරී (PS6 - ප්‍රවර්ගය A) - තනතුරු 01 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හි

### සුදුසුකම් : පහත (අ) හෝ (ආ) හෝ (ඇ)

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ ඉහත **හෝ** අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකම් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තියවේදී ආයතනයක් වෙතින් ලබාගත් එහි ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තියවේදී සුදුසුකමක් **හෝ** අදාළ ක්ෂේත්‍රයට අදාළ වන තනතුරක් සඳහා තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තිය කුසලතා 7 මට්ටමට නොඅඩු, ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම සහ මූල්‍ය ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 3 ක පළපුරුද්ද.

(ආ) අදාළ ක්ෂේත්‍රයට අදාළ වන තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** මූල්‍ය ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 8 ක පළපුරුද්ද.

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළවන තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** මූල්‍ය ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 13 ක පළපුරුද්ද.

### ලුහුඬු රැකියා විස්තරය :

මූල්‍ය හා ගිණුම් කටයුතු වලට අදාළ කර්තව්‍යයන් සඳහා මූල්‍ය කළමනාකරණ විශේෂඥවරයා හට සහයවීම.

## 12. සමාජ ආරක්ෂණ නිලධාරී (PS6 - ප්‍රවර්ගය A) - තනතුරු 02 - උතුරු මැද පළාත සහ උතුරු පළාත හි

### සුදුසුකම් : පහත (අ) හෝ (ආ) හෝ (ඇ)

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජවිද්‍යාව, සමාජයීය කටයුතු, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් **හෝ** ඉහත හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තියවේදී ආයතනයකින් ලබාගත්, එහි ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තියවේදී සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් ලබාගත්/ නිකුත් කරන ලද ජාතික වෘත්තිය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 3 ක පළපුරුද්ද.

(ආ) අදාළ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 ක පළපුරුද්ද

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම **සහ** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 13 ක පළපුරුද්ද.

### ලුහුඬු රැකියා විස්තරය :

සමාජ හා පරිසර ආරක්ෂණ විශේෂඥවරයා සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක සතුවීම සමාජ සංවර්ධන රාමුව සකස් කිරීම/ සැලසුම් කිරීම සඳහා සහ සංවර්ධන ප්‍රතිඵල ධනාත්මක බව තහවුරු කර ගැනීම සහ ව්‍යාපෘති මැදහත්වීම් කරණ කොට ගෙන සිදුවන සමාජයීය බලපෑම්/ ආවේග විචල්‍යයන් හඳුනාගැනීම හා උචිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක හා ප්‍රමාණාත්මක දර්ශකයන් සමාජයීය වෙනස්වීම් ගණනයකර මිනුම්ගත කිරීම සඳහා **සහ** ඒවා විශ්ලේෂණය කිරීම සඳහා ඉහළ ගුණාත්මක තත්ත්වයේ මනාව සකසන ලද දත්ත පවතින බව තහවුරු කර ගැනීම සඳහා සහය වීම.

## 13. ස්ත්‍රී පුරුෂ සමාජතාව සංවර්ධන නිලධාරී (PS6 - ප්‍රවර්ගය A) - තනතුරු 01 - ඌව පළාතේ

### සුදුසුකම් : පහත (අ) හෝ (ආ) හෝ (ඇ)

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජවිද්‍යාව, සමාජයීය කටයුතු හා ස්ත්‍රී පුරුෂ සමාජභාව අධ්‍යයන කටයුතු **හෝ** වෙන යම් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තියවේදී ආයතනයකින් ලබාගත්, එහි ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තියවේදී සුදුසුකමක් **හෝ** අදාළ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් ලබා ගත්/ නිකුත් කළ ජාතික වෘත්තිය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 3 ක පළපුරුද්ද

(ආ) අදාළ ක්ෂේත්‍රයට අදාළ වන තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත්කරනු ලැබූ, ජාතික වෘත්තිය කුසලතා 6 මට්මට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 8 ක පළපුරුද්ද.

(ඇ) තනතුරට අදාළ ක්ෂේත්‍රයක තනතුරක් සඳහා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයිකන් නිකුත් කරනු ලැබූ. ජාතික වෘත්තිය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 13 ක පළපුරුද්ද.

### ලුහුඬු රැකියා විස්තරය :

පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා හට **සහ** සමාජයීය හා පාරිසරික ආරක්ෂණ විශේෂඥවරයාහට ව්‍යාපෘති ක්ෂේත්‍රයන්හි/ ප්‍රදේශයන්හි වාරිමාර්ග සහ කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි අදාළ වන ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන්ට අදාළ ගැටලු විසඳීම සඳහා මූලෝපායික උපක්‍රම නිර්මාණය කිරීම සඳහා සහය වීම **සහ** අතිකුත් විශේෂඥයින් නිලධාරීන් **සහ** උනන්දුවක් දක්වන ආයෝජකයින්/ පාර්ශවකාර සංවිධාන/ අයතන **සමග** වාරිමාර්ග සංවර්ධනය **හා** කෘෂිකාර්මික සැලැස්ම යනාදිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අංශයන්, ඒකාග්‍රව පවතින බවට සහතික කර ගැනීම සඳහා සම්පව කටයුතු කිරීම.

## 14. කෘෂිකාර්මික පහසුකම්කාරක - තනතුරු 47 - පළාත් මට්ටමේ

ව්‍යාපෘති ප්‍රදේශවල පහත සඳහන් ගොවිජන සේවා කොට්ඨාසයන්හි පවතින කෘෂිකාර්මික පහසුකම් කාරකයන් ගේ පුරප්පාඩු පිරවීම සඳහා. අයදුම්පත් කැඳවනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ගොවිජන සේවා කොට්ඨාස |
|---|---|
| කුරුණෑගල | රඹේ, මොරගොල්ලාගම, ඇහැටුවැව, අඹන්පොල, මහනාන්නේරිය, ගල්ගමුව, නඹුත්ත සහ රාජාංගනය |
| පුත්තලම | වනාතවිල්ලුව, ඉහළ පුලියන්කුලම සහ නවගත්තේගම |
| අනුරාධපුර | යක්කල, කෝනාවැව, පරංගියාවාඩිය, හොරොව්පතාන, කහටගස්දිගිලිය, ගලෙන්බිඳුනුවැව, රත්මල්ගහවැව, රනෝරාව, තන්තිරිමලේ සහ පේමඩුව |
| කිලිනොච්චිය | අක්කරයන්, මූලන්කාවිල්, පූනරීන් |
| මුලතිව් | තුනුක්කායි, මුල්ලියාවලෙයි, පුදුකුඩියිරිප්පු සහ ඔඩ්ඩුසුඩාන් |
| ත්‍රිකුණාමලය | පාන්කුලම්, කුච්චවේලි, පුල්මුඩේ, පදවිසිරිපුර සහ ගෝමරන්කඩවල |
| මඩකලපුව | වන්ඩාර මූලෙයි, කරතියන්නාරු සහ අයිතියාමලෙයි |
| අම්පාර | පොතුවිල්, කෝමාරි, පානම සහ ලාහුගල |
| හම්බන්තොට | බෙරලිපොල, වීරවිල, බඳගිරිය, යෝධකන්ඩිය |
| මොණරාගල | තෙලුල්ල, වැල්ලවාය සහ බුත්තල |

### සුදුසුකම් :

අ.පො.ස. (සා/පෙ) විභාගය, දෙවතාවකට (2) නොවැඩි වාර ගණනකදී, ඉංග්‍රීසි, සිංහල/ දෙමළ භාෂාව **සහ** ගණිතය ඇතුළුව, විෂයයන් හතරකට (04) කට සම්මාන සමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම

**සහ**

ශ්‍රී ලංකාවේ පිළිගත් ආයතනයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ දෙවසරක ඩිප්ලෝමාවක් ලබා තිබීම

**හෝ**

කෘෂිකර්මය පිළිබඳ ක්ෂේත්‍රයක, තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තිය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලෙස, තාක්ෂණික වෘත්තිය කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්.

### වැටුප :

අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 3.2.3 වගන්තිය සහ අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හි, වැටුප් කේතය : MT1 - 2016 මත පදනම්ව කෘෂිකර්ම පහසුකම් සපයන්නන් සඳහා වැටුප් ගෙවනු ලැබේ.

**පහත සඳහන් සුදුසුකම් සහිත අපේක්ෂකයින් හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

- ❋ ඉහත සඳහන් ගොවිජන සේවා කොට්ඨාස ප්‍රදේශයන්හි පදිංචිකරුවන්
- ❋ වියළි කලාපයේ කෘෂිකාර්මික පරිචයන්, භාවිතාවන් පිළිබඳ පළපුරුද්ද, ප්‍රජා බලමුළුගැන්වීම් සහ පුහුණුව පිළිබඳ පළපුරුද්ද සහිත
- ❋ ක්ෂේත්‍රයේ සංචාරය සඳහා යතුරු පැදියක් තිබීම.

### ලුහුඬු රැකියා විස්තරය :

ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට සහ කෘෂිකර්ම උපදේශකවරුන්ට (AI) දේශගුණ සුහුරු කෘෂිකර්ම (CSA) භාවිතයන් පිළිබඳ කටයුතුවලට සහායවීම. දේශගුණ සුහුරු කෘෂිකර්ම පරිචයන් භාවිතා කිරීමට ගොවියන් බලමුළු ගන්වා මෙහෙයවීම, ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිමහත්ම මහත්මින් සංවිධානය කිරීම හා ඔවුන්ට තාක්ෂණික සහාය ලබාදීම. ගොවිපල සැලැස්ම නිර්මාණය කිරීමට ගොවි මහතුන්ට සහය වීම, CSA පරිචයන්/ භාවිතාවන් ක්‍රියාවේ යෙදවීම සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම, ගොවියන්ට අවශ්‍ය පැළ කිරීම් ද්‍රව්‍ය හා වෙනත් ආදාන යෙදවුම් ලබාදීම, ප්‍රගතිය හා ව්‍යාපෘති කටයුතු පිළිඳව තොරතුරු එක්රැස් කිරීම, නිෂ්පාදන සමිතිවල හා නිෂ්පාදන සංගම්/ සංවිධාන වල සංවර්ධන කටයුතු සඳහා සහාය ලබා දීම.

ගොවි නිෂ්පාදන අලෙවිය සඳහා ආධාර සහ සහය ලබා දීම, ගොවීන් වෙළඳපළවල්වල **සහ** ව්‍යාපාර අස්තිත්වයන්/ ආයතනයන් හා සම්මත **සහ** සම්බන්ධ කිරීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට පහසුකම් සලසා දීම.

## පොදු කොන්දේසි :

1. වයස : අයදුම් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ක් (හැට හතරක්) වීම.
2. සියලු පත්වීම් මූලිකව එක් වසරක කාල සීමාවක් සඳහා වන අතර, සේවා දීර්ඝ කර ගැනීම, සාර්ථක කාර්ය සාධනය මත පදනම්ව වනු ඇත.
3. සේවකයින් විසින් අවශ්‍යතාවය මත පදනම්ව, ව්‍යාපෘති වැඩබිම්වලට සංචාරය කිරීම අවශ්‍ය වනු ඇත.
4. ශ්‍රී ලංකාවේ, විදේශීය අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල සේවය කිරීම තුළින් ලත් කාරක පළපුරුද්දක් සහිත වීම වාසි දායක වනු ඇත.
5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පරිගණක සාක්ෂරතාව සහ රජයේ නීතිරීති රෙගුලාසි පිළිබඳව හුරුපුරුදු බව.
6. එක් එක් තනතුර සඳහා වැටුප, 2019 මාර්තු මස 05 දතම සහ අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වනු ඇත.
7. සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව, කෙටිලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවනු ලැබේ.

## අයදුම්පත් :

- ❋ සියලුම අයදුම්කරුවන් විසින්, ස්වකීය අයදුම්පත්, සියලු සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සමග, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සියලු සහතික පත් වල පිටපත් සමගින් පහත ලිපිනයට **2022 අප්‍රියෙල් මස 01 වන දිනට හෝ ඊට පෙර** ලැබෙනසේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**61/1, M.D.H. ජයවර්ධන මාවත, මාදින්නාගොඩ, රාජගිරිය.**

- ❋ දැනට රජයේ/ අර්ධ රාජ්‍ය සේවාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත්, සිය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
- ❋ එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, වෙන වෙනම අයදුම්පත් වෙන වෙනම ලිපි කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.
- ❋ ඉහත සඳහන් බඳවා ගැනීම් පිළිබඳව, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, ලේකම්ගේ තීරණය අවසාන හා තීරනාත්මක වනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පිවිසෙන්න. වෙබ් අඩවිය : www.csiap.lk වෙත.

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය.**